**2018-2019 වර්ෂ සඳහා හෙද අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාවට විද්‍යාවේදී හෙද උපාධිධාරීන් බඳවා ගැනීමට නිකුත් කරන ලද ගැසට් පත්‍රය සංශෝධනය කිරීම**

සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ හෙද අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සඳහා විද්‍යාවේදී හෙද උපාධිය ලබා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවීම සඳහා නිකුත් කරන ලද අංක 2118 හා 2019.04.05 දිනැති *ගැසට්* පත්‍රයේ 03(ඊ), (උ), 04(ඇ), 06 හා ආදර්ශ අයදුම්පතෙහි 07. (ආ) වගන්ති පහත පරිදි සංශෝධනය කරනු ලබන අතර අනෙකුත් වගන්ති නොවෙනස්ව පවතී.

වසන්තා පෙරේරා,<br>
ලේකම්,<br>
සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.

2019 ජූලි මස 19 වැනි දින,<br>
කොළඹ 10,<br>
අංක 385,<br>
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,<br>
සෞඛ්‍ය පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ දී ය.

සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

**හෙද අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සඳහා විද්‍යාවේදී හෙද උපාධිධාරීන් බඳවා ගැනීම 2018-2019**

03. (ඊ)

2019.08.16 දිනට වයස 18ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

03. (උ)

අදාළ උපාධිය බලපැවැත්වෙන දිනය 2019.08.16 දිනට පෙර දිනයක් විය යුතුය.

04. (ඇ)

නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් කවරයකට බහා එම කවරයේ ඉහළ වම් කෙළවරේ "හෙද අනුස්ථාපන හා සමායෝජන පුහුණුව සඳහා විද්‍යාවේදී හෙද උපාධිධාරීන් බඳවා ගැනීම - 2018-2019 වශයෙන් හා අදාළ උපාධිය හා අධ්‍යයන වර්ෂය ද සඳහන් කර අධ්‍යක්ෂ (පාලන) 01, සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, සුවසිරිපාය, අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10 ලිපිනයට 2019.08.16 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

*සටහන* - ඉහත (2) හා (3) යටතේ දක්වෙන සුදුසුකම් හා අනෙකුත් සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය වන 2019.08.16 දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

06.

මෙම පොදු චක්‍රලේඛයේ දක්වෙන නියමයන්ට අනුකූල නොවන, අසම්පූර්ණ, ආදර්ශ ආකෘති පත්‍රයට අනුකූල නොවන, මූලික සුදුසුකම් සම්පූර්ණ කර නොමැති බැංකු ලදුපත අලවා නොමැති හා 2019.08.16 දින හෝ ඊට පෙර ලියාපදිංචි කර නොමැති අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර අයදුම්පත් ලද බව දන්වා එවනු නොලැබේ.

ආදර්ශ අයදුම්පතෙහි 07. (ආ)

2019.08.16 දිනට වයස - අවුරුදු :————. මාස :————. දින :————.